මහෙස්ත්‍රාත් අධිකරණය
03 OCT 1988
අනුරාධපුරය

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

---

# 1988 අංක 17 දරන ජනමතවිචාරණ (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1988 මැයි මස 24 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1988 මැයි මස 27 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකිය

මිල : රු. 1.20 යි. තැපැල් ගාස්තුව : ශත 75 යි.

# 1988 අංක 17 දරන ජනමතවිචාරණ (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1988 මැයි මස 24 වන දින]

එල්. ඩී.—ඕ. 21/88

## 1981 අංක 7 දරන ජනමතවිචාරණ පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

**ලුහුඬු නාමය.**

1. මේ පනත 1988 අංක 17 දරන ජනමතවිචාරණ (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

**1981 අංක 7 දරන පනතේ 9 වන වගන්තිය සංශෝධනය කිරීම.**

2. (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1981 අංක 7 දරන ජනමතවිචාරණ පනතේ 9 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (අ) ඡේදයෙහි "පොලිස් දෙපාර්තමේන්තුවේ, ශ්‍රී ලංකා ආණ්ඩුවේ දුම්රිය දෙපාර්තමේන්තුවේ" යන වචන වෙනුවට, "පොලිස් දෙපාර්තමේන්තුවේ, බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ, ශ්‍රී ලංකා ආණ්ඩුවේ දුම්රිය දෙපාර්තමේන්තුවේ" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

**ප්‍රධාන ප්‍රඥප්තියේ 17 වන වගන්තිය සංශෝධනය කිරීම.**

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 17 වන වගන්තිය, පහත දැක්වෙන පරිදි, මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියෙහි "පත් කරනු ලැබූ තැනැත්තන්ගේ නම් සහ ලිපිනයන්" යන වචන වෙනුවට "පත් කරනු ලැබූ තැනැත්තන්ගේ නම්, ජාතික හෝ ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවක් විසින් හෝ රජයේ සංස්ථාවක් විසින් හෝ නිකුත් කරන ලද වෙනත් හැඳුනුම් පත් අංක සහ ලිපිනයන්" යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(2) ඒ වගන්තියේ (3) වන උපවගන්තියෙහි "අලුත් ඡන්ද නිරීක්ෂකයගේ නම සහ ලිපිනය" යන වචන වෙනුවට "අලුත් ඡන්ද නිරීක්ෂකයගේ නම, ජාතික හෝ ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවක් විසින් හෝ රජයේ සංස්ථාවක් විසින් හෝ නිකුත් කරන ලද වෙනත් හැඳුනුම්පත් අංකය සහ ලිපිනය" යන වචන ආදේශ කිරීමෙන්.

**ප්‍රධාන ප්‍රඥප්තියේ 33 වන වගන්තිය සංශෝධනය කිරීම.**

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 33 වන වගන්තිය, පහත දැක්වෙන පරිදි, මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) ඒ වගන්තියේ (2) වන උපවගන්තිය ඉවත් කර, ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් :—

"(2) (1) වන උපවගන්තිය යටතේ පත් කරන ලද තැනැත්තන්ගේ නම් ජාතික හෝ ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවක් විසින් හෝ රජයේ සංස්ථාවක් විසින් හෝ නිකුත් කරන ලද වෙනත් හැඳුනුම් පත් අංක සහ ලිපිනයන් ප්‍රකාශ කෙරෙන ලියවිල් ලකින් වූ දැන්වීමක් ඡන්ද ගණන් කිරීම ආරම්භ වීමට පෙර, ජනමතවිචාරණ නියෝජිතයා විසින්

ඒ—102750—8,260 (88/04)

හෝ 17 වන වගන්තියේ (2) වන උපවගන්තියෙහි සඳහන් තැනැත්තා විසින් හෝ ගණන් කිරීමේ නිලධරයා වෙත දෙනු ලැබිය යුතු ය. නම, ජාතික හෝ ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවක් විසින් හෝ රජයේ සංස්ථාවක් විසින් හෝ නිකුත් කරන ලද ඡේවනත් හැඳුනුම් පත් අංකය සහ ලිපිනය එසේ දී නොමැති යම් ගණන් කිරීමේ නිරීක්ෂකයකු, ගණන් කිරීමේ මධ්‍යස්ථානයට ඇතුළු කර ගැනීම, ගණන් කිරීමේ නිලධරයා විසින් ප්‍රතික්ෂේප කරනු ලැබිය හැකිය.";

(2) ඒ වගන්තියේ අවසානයට පහත දැක්වෙන අලුත් උපවගන්තිය එකතු කිරීමෙන් :—

"(3) (1) වන උපවගන්තිය යටතේ පත් කරන ලද ගණන් කිරීමේ නිරීක්ෂකයන්, ඡන්ද ගණන් කරන විට පැමිණ සිටීමට පෙර, ජනමත විචාරණ තේරීම් භාර නිලධරයා වෙත පෙනී සිටිය යුතු අතර, ඒ තේරීම් භාර නිලධරයා විසින්, ඒ එක් එක් නිරීක්ෂක වෙත, යම් නිශ්චිත ගණන් කිරීමේ මධ්‍යස්ථානයකට ඇතුලුවීමට ඉල්ලා සිටීමේ බලය ප්‍රදානය කරනු ලැබිය යුතු ය.".

**ප්‍රධාන ප්‍රඥප්තියේ 43 වන වගන්තිය සංශෝධනය කිරීම.**

5. ප්‍රධාන ප්‍රඥප්තියේ 43 වන වගන්තියෙහි (ආ) ඡේදයට ඉක්බිතිව ම, පහත දැක්වෙන අළුත් ඡේදය ඇතුළත් කිරීමෙන්, ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

"(ආආ) ඡන්ද පොලක් ඇතුළත දී, ලකුණු කරන ලද ඡන්ද පත්‍රිකාවක් හිතාමතාම ප්‍රදර්ශනය කිරීම ; හෝ"

**ප්‍රධාන ප්‍රඥප්තියට අලුත් කොටසක් එකතු කිරීම.**

6. ප්‍රධාන ප්‍රඥප්තියේ 61 වන වගන්තියට ඉක්බිතිව ම, පහත දැක්වෙන අලුත් කොටස මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එම කොටස ප්‍රධාන ප්‍රඥප්තියේ V වන කොටස ලෙස බලපැවැත්විය යුතු ය :—

"V වන කොටස

ජනමතවිචාරණ පෙත්සම්

**ජනමතවිචාරණ පෙත්සමක් මත ජනමත විචාරණයක් අවලංගුවීම.**

61අ. (1) ශ්‍රේෂ්ඨාධිකරණය සෑහීමට පත්වන පරිදි ඔප්පු කරනු ලැබිය හැකි පහත දැක්වෙන හේතුවලින් කිසිවක් පිළිබඳ වූ ජනමතවිචාරණ පෙත්සමක් මත මුළු ජනරජය සම්බන්ධයෙන් වූ ජනමතවිචාරණයක් අවලංගු ලෙස ප්‍රකාශ කරනු ලැබිය යුතු ය. ඒ කරුණු නම්—

(අ) පොදු අල්ලස හෝ පොදු සංග්‍රහ කිරීම හෝ පොදු බිය ගැන්වීම හෝ, මෙහි ඉහත දැක්වුණු විෂමාචාරවලට හෝ අවස්ථාවලට හෝ සමාන වන නැතහොත් සමාන නොවන විෂමාචාරවල හෝ අවස්ථාවල හේතුවෙන් එම ජනමතවිචාරණයේ දී ඡන්දය දීමෙන්

ඡන්දහිමියන්ගෙන් කොටසක් වළක්වනු ලැබ තිබීම සහ ඒ මගින් ජනමත විචාරණයේ ප්‍රතිඵල කෙරෙහි වැදගත් බලපෑමක් සිදුවී තිබීම ;

(ආ) මේ පනතේ විධිවිධානවල දක්වා ඇති ප්‍රතිපත්තිවලට අනුකූලව ජනමතවිචාරණය පවත්වා නොමැති බවත් එසේ අනුකූල නොවීම, ජනමතවිචාරණයේ ප්‍රතිඵලවලට වැදගත් ලෙස බලපා ඇති බවත් පෙනී යයි නම් ජනමතවිචාරණය කට අදාළව, මේ පනතේ විධිවිධානවලට අනුකූලව කටයුතු කර නොතිබීම.

(2) දූෂණ හෝ නීති විරෝධී ක්‍රියා හෝ කර ඇතැයි එම පෙත්සමෙහි චෝදනා කරනු ලැබ සිටින තැනැත්තා විසින් හෝ ඔහුගේ දැනීම හෝ අනුමතිය ඇතිව වෙනත් යම් තැනැත්තකු විසින් හෝ ජනමතවිචාරණයකට අදාළව දූෂණ හෝ නීති විරෝධී ක්‍රියාවක් කරනු ලැබ තිබීමේ සහ, ඒ බව ශ්‍රේෂ්ඨාධිකරණය සෑහීමට පත්වන පරිදි ඔප්පු කර තිබීමේ හේතුව මත ජනමතවිචාරණ පෙත්සමක දී යම් මැතිවරණ කොට්ඨාසයක් සම්බන්ධයෙන් ජනමතවිචාරණයේ ප්‍රතිඵල අවලංගු බවට ප්‍රකාශ යට පත් කරනු ලැබිය යුතු ය.

ජනමතවිචාරණ පෙත්සම් ශ්‍රේෂ්ඨාධිකරණය විසින් විභාග කර තීරණය කරනු ලැබිය යුතු බව.

61ආ. ජනමතවිචාරණ පෙත්සමක් සම්බන්ධයෙන් වූ නඩු කටයුත්තක් යටත් පිරිසෙයින් ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරයන් පස් දෙනකු විසින් විභාග කර තීරණය කළ යුතු අතර, අග්‍ර විනිශ්චයකාරවරයා අන්‍යාකාර විධානයක් කළ හොත් මිස, ඔහු ඔවුන් අතුරින් එක් විනිශ්චයකාර වරයෙක් විය යුතු ය.

පෙත්සම කවරකු විසින් ඉදිරිපත් කළ හැකිද යන වග.

61ඇ. පිළිගත් දේශපාලන පක්ෂයක ලේකම් වරයකු විසින් හෝ කිසියම් ඡන්ද හිමියකු විසින් හෝ ශ්‍රේෂ්ඨාධිකරණය වෙත ජනමත විචාරණ පෙත්සමක් ඉදිරිපත් කරනු ලැබිය හැකි ය.

ඉල්ලා සිටිය හැකි සහන.

61ඈ. පෙත්සම්කරුට හිමිකම් ලැබිය හැකි පහත දැක්වෙන සහන සියල්ලම හෝ ඒවායින් කිසිවක් ජනමතවිචාරණ පෙත්සමකදී පෙත්සම් කරුවකු විසින් ඉල්ලා සිටිනු ලැබිය හැකිය ; ඒවා නම් :—

(අ) මුළු ජනරජය සම්බන්ධයෙන්ම, ජනමතවිචාරණය අවලංගු වන බවට ප්‍රකාශයක් ; නැතහොත්

(ආ) කිසියම් මැතිවරණ කොට්ඨාසයක් සම්බන්ධ යෙන් ජනමතවිචාරණය අවලංගු වන බවට ප්‍රකාශයක්.

පෙත්සමෙහි අඩංගු විය යුතු කරුණු.

61ඉ. ජනමතවිචාරණ පෙත්සමක—

(අ) මේ පනතේ 61ඈ වගන්තිය යටතේ පෙත්සම ඉදිරිපත් කිරීමට පෙත්සම්කරුට ඇති අයිතිවාසිකම සඳහන් විය යුතු ය;

(ආ) ජනමතවිචාරණය පැවැත්වීම සහ ප්‍රතිඵලය පිළිබඳව සඳහන් විය යුතු ය;

(ඇ) පෙත්සම්කරු විශ්වාසය තබන වැදගත් කරුණු පිළිබඳව ලුහුඬු ප්‍රකාශයක් ඇතුළත් විය යුතු ය;

(ඈ) එම දූෂණය හෝ නීති විරෝධී ක්‍රියාව හෝ කරණ ලදැයි කියන පාර්ශ්වකරුවන්ගේ නම් සහ එම ක්‍රියා කරන ලද දිනය සහ ස්ථානය පිළිබඳව හැකිතාක් සම්පූර්ණ වූ ප්‍රකාශයක් ඇතුළත්ව, කරන ලදැයි පෙත්සම්කරු කියා සිටින යම් දූෂණ හෝ නීති විරෝධී ක්‍රියා පිළිබඳ සම්පූර්ණ විස්තර දක්වා තිබිය යුතු අතර, එම දූෂණ හෝ නීති විරෝධී ක්‍රියා හෝ පිළිබඳ චෝදනාව සහ එම ක්‍රියා කරන ලද දිනය සහ වේලාව, සනාථ කරන දිවුරුම් ප්‍රකාශයක් ද තිබිය යුතු ය;

(ඉ) උදාහරණයක් ලෙස, යම් මැතිවරණ කොට්ඨාසයක් වෙනුවෙන් වූ ජනමතවිචාරණය අවලංගු ලෙස ප්‍රකාශ කරනු ලැබිය යුතු ය, වැනි ආයාචනයක් සමග එය අවසන් කර තිබිය යුතු අතර, සියලුම පෙත්සම්කරුවන් විසින් අත්සන් තබා තිබිය යුතු ය;

එසේ වුවද, මෙම වගන්තියේ ඉහත සඳහන් විධිවිධාන කිසිවක් මගින්, පෙත්සමෙහි සාක්ෂි සඳහන් කිරීම නියම කර ඇති ලෙස සලකනු නොලැබිය යුතු අතර, එසේ තේරුම් නොගත යුතු ය.

ශ්‍රේෂ්ඨාධිකරණය ඉදිරියේ කාර්ය පටිපාටියට අදාළ විශේෂ විධිවිධාන.

61ඊ. (1) ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ගාස්තු පිළිබඳව හෝ අන් ආකාරයෙන් හෝ සුදුසු යයි ශ්‍රේෂ්ඨාධිකරණය සලකන නියමයන් මත, පෙත්සම පිළිබඳව සාධාරණ හෝ එලදැයී හෝ විභාගයක් සහතික කිරීම සඳහා අවශ්‍ය යයි ශ්‍රේෂ්ඨාධිකරණය සලකන ආකාරයට ජනමතවිචාරණ පෙත්සමෙහි සඳහන් යම් දූෂණ හෝ නීති විරෝධී ක්‍රියා හෝ පිළි

බඳ විස්තර සංශෝධනය කිරීමට නැතහොත් පුළුල් කිරීමට ඉඩදෙනු ලැබිය හැකි ය ; එසේ වුවද එම පෙත්සමෙහි කලින් චෝදනා කර නොමැති කිසියම් දූෂණ හෝ නීති විරෝධී ක්‍රියා හෝ පිළිබඳ විස්තර ඇතුළත් කිරීමක්, එම සංශෝධනයෙහි හෝ පුළුල් කිරීමෙහි ප්‍රතිඵලය වේ නම්, ශ්‍රේෂ්ඨාධිකරණය එම සංශෝධනයට හෝ පුළුල් කිරීමට හෝ ඉඩ නොදිය යුතු ය.

(2) සෑම ජනමතවිචාරණ පෙත්සමක්ම හැකි තාක් කඩිනමින් විභාග කරනු ලැබිය යුතු අතර, එම පෙත්සම ඉදිරිපත් කරන දිනයෙන් පසු හය මසක කාලසීමාවක් ඇතුළත එම පෙත්සම පිළිබඳ විභාගය අවසන් කිරීම පිණිස සෑම ප්‍රයත්නයක්ම දරනු ලැබිය යුතු ය. එම පෙත්සම පිළිබඳ නඩු විභාගය අවසන් කළ දිනයෙන් පසුව, අයුතු ප්‍රමාදයකින් තොරව ශ්‍රේෂ්ඨාධිකරණය විසින්, එම පෙත්සම තීරණය කරමින් තම ආඥාව කරනු ලැබිය යුතු ය.

ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණය.

61උ. ජනමතවිචාරණ පෙත්සමක නඩු විභාගය අවසන් කළ විට, ශ්‍රේෂ්ඨාධිකරණය විසින් අවස්ථාවෝචිත පරිදි මුළු ජනරජය සම්බන්ධයෙන් හෝ කිසියම් මැතිවරණ කොට්ඨාසයක් සම්බන්ධයෙන් හෝ ජනමතවිචාරණය අවලංගු වී තිබේදැයි තීරණය කර, එම තීරණය ලියවිල්ලකින් සහතික කරනු ලැබිය යුතු ය.

එම සහතිකය සම්බන්ධයෙන් මෙහි මතු විධිවිධාන සලසා ඇති පරිදි කටයුතු කරනු ලැබිය යුතු ය.

දූෂණ හෝ නීති විරෝධී ක්‍රියා හෝ සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණයේ වාර්තාව.

61ඌ. ජනමතවිචාරණ පෙත්සමක නඩු විභාගය අවසන් කළ විට ශ්‍රේෂ්ඨාධිකරණය විසින්, කිසියම් දූෂණ හෝ නීති විරෝධී ක්‍රියා හෝ සම්බන්ධයෙන් වරදකරු බව නඩු විභාගයේදී ඔප්පු වූ යම් තැනැත්තකු වී නම්, ඒ සෑම තැනැත්තකුගේ ම නම සහ විස්තර දක්වමින් වාර්තාවක් ද සාදනු ලැබිය යුතු ය :

එසේ වුවද, ජනමතවිචාරණ පෙත්සමක පාර්ශ්වකරුවකු නොවන යම් තැනැත්තකු පිළිබඳව ශ්‍රේෂ්ඨාධිකරණය විසින් මේ වගන්තිය යටතේ වාර්තා කරනු ලැබීමට පෙර, ශ්‍රේෂ්ඨාධිකරණය විසින් එම තැනැත්තාට කරුණු කියා සිටීමටත්, තමා පිළිබඳව එසේ වාර්තා නොකළ යුත්තේ මන්දැයි දැක්වීම පිණිස සාක්ෂි ඉදිරිපත් කිරීමට සහ කැඳවීමටත් අවස්ථාවක් දෙනු ලැබිය යුතු ය.

එම වාර්තාව සම්බන්ධයෙන් මෙහි මතු විධිවිධාන සලසා ඇති පරිදි කටයුතු කරනු ලැබිය යුතු ය.

සහතිකය හා වාර්තාව ජනාධිපතිවරයාට ඉදිරිපත් කළ යුතු බව.

61එ. 61ල වගන්තිය යටතේ ශ්‍රේෂ්ඨාධිකරණය විසින් නිකුත් කරන ලද සහතිකය සහ 61ළ වගන්තිය යටතේ සාදන ලද වාර්තාව ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ජනාධිපතිවරයාට යැවිය යුතු ය. ඊට පසුව ජනාධිපතිවරයා විසින් එම සහතිකය හා වාර්තාව කොමසාරිස්වරයාට යැවිය යුතු ය.

සහතිකයේ බලපෑම.

61ඒ. 61ළ වගන්තියේ නියමිත පරිදි, ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණය පිළිබඳ සහතිකය කොමසාරිස්වරයා වෙත යවනු ලැබූ විට, ඒ තීරණය ක්‍රියාත්මක විය යුතු අතර, ඒ අනුව—

(අ) මුළු ජනරජය සම්බන්ධයෙන් ජනමතවිචාරණය ස්ථිර කරනු ලැබිය යුතු ය; නැත හොත්

(ආ) මුළු ජනරජය සම්බන්ධයෙන් ජනමතවිචාරණය අවලංගු ලෙස ප්‍රකාශ කරනු ලැබිය යුතු ය; නැතහොත්

(ඇ) ශ්‍රේෂ්ඨාධිකරණ තීරණයෙහි හෝ නිශ්චයෙහි හෝ බලපෑම යම් මැතිවරණ කොට්ඨාසයක් සම්බන්ධයෙන් ජනමතවිචාරණය අවලංගු ලෙස ප්‍රකාශ කරනු ලැබීම වන අවස්ථාවක, කොමසාරිස්වරයා විසින්, එම සහතිකය ලැබී එක් මාසයක් ඇතුළත ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන දැන්වීමක් මගින්, ඒ මැතිවරණ කොට්ඨාසය සම්බන්ධයෙන් ජනමතවිචාරණයක් පවත්වන ලෙස නියම කරනු ලැබිය යුතු ය.

වාර්තාවේ බලපෑම.

61ඔ. (1) (අ) 61ඒ වගන්තිය යටතේ කොමසාරිස්වරයා වෙත යවන ලද ශ්‍රේෂ්ඨාධිකරණයේ වාර්තාව ඔහු වෙත ලැබුණු විට, ඔහු විසින් වහාම එම වාර්තාවේ පිටපතක් ගැසට් පත්‍රයෙහි පළ කිරීමට සැලැස්විය යුතු ය.

(ආ) (අ) ඡේදයෙහි සඳහන් වාර්තාව යම් තැනැත්තකු විසින් දූෂණ හෝ නීති විරෝධී හෝ ක්‍රියාවක් කර තිබෙන බවට වන අවස්ථාවක, ඒ තැනැත්තා එකී වාර්තාවේ දිනයෙහි ඒ වරද සම්බන්ධයෙන් වරදකරු කරනු ලැබ ඇත්තාක් මෙන් එම අශක්තතාවලට ම යටත් විය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන එවැනි සෑම වාර්තාවක් ම වහාම කියවා බලා, ජනමතවිචාරණයක දී ඡන්දය දීමට නොහැකි අයකු ලෙස වාර්තාවෙන් පෙනී යන සෑම තැනැත්තකුගේම නම, ඡන්දහිමි නාම ලේඛනයෙන් වහාම ඉවත් කිරීම, සෑම ලියාපදිංචි කිරීමේ නිලධරයකුගේ ම කාර්යය විය යුතු ය.

ඉදිරිපත් කිරීම සඳහා කාලය.

61ඹ. (1) සෑම ජනමතවිචාරණ පෙත්සමක් ම, ජනමතවිචාරණයේ ප්‍රතිඵල ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබූ දිනයෙන් දින විසි එකක් ඇතුළත දී ඉදිරිපත් කරනු ලැබිය යුතු ය:

එසේ වුවද, දූෂණ හෝ නීති විරෝධී හෝ ක්‍රියාවක් මත, විශේෂයෙන් ම එම දූෂණ හෝ නීති විරෝධී හෝ ක්‍රියාව කරන ලදැයි කියන තැනැත්තා විසින් හෝ ඔහුගේ දැනීම ඇතිව වෙනත් තැනැත්තකු විසින් හෝ ඉහත කී දිනයට පසුව මුදල් ගෙවීමක් කළ බවට හෝ වෙනත් ක්‍රියාවක් කරන ලද බවට චෝදනා කරමින්, ජනමතවිචාරණය පිළිබඳව ප්‍රශ්න කෙරෙන ජනමතවිචාරණ පෙත්සමක්, එම දූෂණ හෝ නීති විරෝධී හෝ ක්‍රියාවට අදාළව, එම ගෙවීම හෝ ක්‍රියාව හෝ කරන ලද දිනයෙන් දින විසි අටක් ඇතුළත යම් අවස්ථාවක දී ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(2) දූෂණ හෝ නීති විරෝධී හෝ ක්‍රියාවක් පිළිබඳ චෝදනාවක් මත ජනමතවිචාරණයක වලංගු භාවය ප්‍රශ්න කිරීමේ කාර්යය සඳහා නිසි කාලය තුළ ඉදිරිපත් කරන ලද ජනමතවිචාරණ පෙත්සමක්, ඒ හේතුව මත ජනමතවිචාරණයක වලංගු භාවය ප්‍රශ්න කිරීමට ජනමතවිචාරණ පෙත්සමක් ඉදිරිපත් කරනු ලැබිය හැකි කාලය තුළ, ශ්‍රේෂ්ඨාධිකරණ විනිශ්චයකාරවරයකුගේ අනුමැතිය ඇතිව සංශෝධනය කරනු ලැබිය හැකි ය.

ඡන්ද දය හෙළිදරව් කිරීම නහනම් බව.

61ක. ජනමතවිචාරණයක දී ඡන්දය දුන් කිසිම ඡන්ද හිමියකුට, එම ජනමතවිචාරණයේ වලංගු භාවය පිළිබඳව ප්‍රශ්න කෙරෙන කිසිම නඩු කටයුත්තකදී එම ජනමතවිචාරණයේ දී ඔහු ඡන්දය දුන් ආකාරය ප්‍රකාශ කරන ලෙස නියම කරනු නොලැබිය යුතු ය.

නිරීක්ෂණය කදී අත් හළ යුතු ඡන්ද.

61ග. (1) ජනමතවිචාරණයක නඩු විභාගයක නිරීක්ෂණයක දී පහත සඳහන් ඡන්ද පමණක් අත්හළ යුතු ය. ඒවා නම්—

(අ) ඡන්දය සටහන් වී ඇති ඡන්ද පොළට වෙන් කරන ලද ඡන්ද හිමි නාම ලේඛනයෙහි නම සඳහන්ව නොතිබුණ යම් තැනැත්තකුගේ ඡන්දය;

(ආ) අල්ලස, සංග්‍රහ කිරීම හෝ අයුතු බලපෑම මගින්, ඡන්දය ලබා ගත් යම් තැනැත්තකුගේ ඡන්දය;

(ඇ) ජනමතවිචාරණයේ දී අන්‍යයකුගේ නාම යෙන් පෙනී සිටි හෝ පෙනී සිටීමට සැලැස්සූ යම් තැනැත්තකුගේ ඡන්දය;

(ඈ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 89 වන ව්‍යවස්ථාවේ (ඉ), (ඊ), (උ), (ඌ), (එ) සහ (ඒ) ඡේද යන් ක්‍රියාත්මකවීමේ හේතුවෙන් ජනමත විචාරණයේදී ඡන්දය දීමට අශක්නුතාවට පත් යම් තැනැත්තකුගේ ඡන්දය;

(ඉ) 9 වන වගන්තියේ (1) වන උපවගන්තියේ හේතුවෙන් ජනමතවිචාරණයේ දී පුද්ගලි කව ඡන්දය දීමට අයිතියක් නොමැති තැනැත්තකුව සිටියදී ජනමතවිචාරණයේ දී පුද්ගලිකව ඡන්දය දුන් තැනැත් තකුගේ ඡන්දය.

(2) (1) වන උපවගන්තියේ (ඈ) ඡේදයෙහි නිශ්චිත අවස්ථාවේ දී හැර, තමන්ගේ නම ඡන්ද හිමි නාමලේඛනයෙහි ඇතුළත්ව තිබීමට සුදුස් සකුව නොසිටි හෝ නොසිටින හේතුව නිසා පමණක් ලියාපදිංචි ඡන්ද හිමියකුගේ ඡන්දය අත් හරිනු නොලැබිය යුතු ය.

(3) නිරීක්ෂණයක දී වලංගු ඡන්දයක් ලෙස ඔප්පු කරනු ලැබූ යම් ද්විතීය ඡන්දයක් පෙත් සමෙහි යම් පාර්ශවකරුවකුගේ ඉල්ලීම පිට ඡන් දයට එකතු කළ යුතු ය.

ජනමත විචාරණ පෙත්සම් සම්බන්ධ යෙන් කාර්ය පටිපාටිය සහ පරිචය.

61ච. මේ පනත යටතේ ජනමතවිචාරණ පෙත්සම් සම්බන්ධයෙන් පටිපාටිය සහ පරිචය, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 136 වන ව්‍යවස්ථාව යටතේ ශ්‍රේෂ්ඨාධි කරණය විසින් සාදන ලද රීතිවලට අනුකූල විය යුතු ය.

ගණන් කිරීමේ නිලධරයා විසින් ඡන්ද පත්‍රිකාවක් ප්‍රතික්ෂේප කිරීම අවසානාත් මක බව.

61ජ. ජනමතවිචාරණ පෙත්සමක දී 35 වන වගන්තිය යටතේ ඡන්ද පත්‍රිකාවක් ප්‍රතික්ෂේප කළ යුතු ද නැද්ද යන්න පිළිබඳව ගණන් කිරීමේ නිලධරයාගේ තීරණය ප්‍රශ්න කරනු නොලැබිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 71 වන වගන්තිය සංශෝධනය කිරීම.

7. ප්‍රධාන ප්‍රඥප්තියේ 71 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ "වැටුප් සහිත නිවාඩු" යන වචන වෙනුවට "වැටුප් සහිත නිවාඩු ලියවිල්ලකින්" යන වචන ආදේශ කිරීමෙන්;

(2) ඒ වගන්තියේ (1) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත සඳහන් අලුත් උපවගන්තිය ඇතුළත් කිරීමෙන් :—

"(1අ) සෑම සේවායෝජකයකු විසින් ම —

(අ) (1) වන උපවගන්තිය යටතේ නිවාඩු ඉල්ලා සිටින තැනැත්තන්ගේ නම්; සහ

(ආ) ඒ උපවගන්තිය යටතේ නිවාඩු දෙනු ලැබුවේ යම් තැනැත්තන්වද, ඒ තැනැත්තන්ගේ නම් සහ ඒ තැනැත්තන්ට ඒ නිවාඩු දෙනු ලැබූ කාල සීමා

දැක්වෙන ප්‍රකාශයක් සකස් කොට, එම ප්‍රකාශය සේවා ස්ථානයේ හොඳින් දර්ශනය වන පරිදි ප්‍රදර්ශනය කිරීමට සැලැස්විය යුතු ය."

(3) ඒ වගන්තියේ (2) වන උපවගන්තියෙහි "(1) වන උප වගන්තියේ විධිවිධාන" යන වචන වෙනුවට "(1) වන උප වගන්තියේ හෝ (1අ) වන උපවගන්තියේ හෝ විධි විධාන" යන වචන ආදේශ කිරීමෙන්.

8. ප්‍රධාන ප්‍රඥප්තියේ 74 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:— ප්‍රධාන ප්‍රඥප්තියේ 74 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියෙහි "ඡන්ද විමසීම පවත්වනු ලබන දිනයට පෙර හත් වන දිනය" යන වචන වෙනුවට "ඡන්ද විමසීම පවත්වනු ලබන දිනයට පෙර දහවන දිනය" යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(2) ඒ වගන්තියේ (1) වන උපවගන්තියට ඉක්බිතිව ම, පහත දැක්වෙන උපවගන්තිය ඇතුළත් කිරීමෙන් :—

"(1අ) (1) වන උපවගන්තියෙහි සඳහන් තැපැල් මගින් කරන ඇනුම්දීමක් භාරදීම පිණිස, ඡන්ද විමසීම පවත්වනු ලබන දිනයට පෙර දහවන දිනයෙන් පසුව, පෝස්ට් මාස්ටර් ජනරාල්වරයා විසින් හෝ ඔහුගේ බලය යටතේ ක්‍රියා කරන යම් තැනැත්තකු විසින් හෝ බාර ගනු ලැබීම ද ඡන්ද විමසීම පවත්වනු ලබන දිනයට පෙර, පස් වන දිනයෙන් පසුව, ඔහු විසින් එය ඡන්ද හිමියකු වෙත භාර දෙනු ලැබීම ද කරනු නොලැබිය යුතු ය.".

9. ප්‍රධාන ප්‍රඥප්තියේ 75 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:— ප්‍රධාන ප්‍රඥප්තියේ 75 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) ඒ වගන්තියේ (2) වන උපවගන්තිය ඉවත් කර, ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් :—

"(2) (1) වන උපවගන්තියේ සඳහන් කාලසීමාව තුළදී, එවැනි පිළිගත් දේශපාලන පක්ෂයකට ප්‍රයෝජනයට ගැනීමට ඉඩ දෙනු ලැබිය යුතු ගුවන් විදුලි ප්‍රචාරක කාලය, පහත දැක්වෙන ආකාරයට තීරණය කරනු ලැබිය යුතු ය:—

(අ) 2 වන වගන්තිය යටතේ ප්‍රකාශනය ප්‍රසිද්ධ කරනු ලැබ සතියක් ඇතුළත, සෑම පිළිගත් දේශපාලන පක්ෂයක් විසින් ම, එය ජනමත විචාරණයේ දී මහජනතාව වෙත ඉදිරිපත් කරනු ලබන යෝජනාවට පක්ෂ ද විපක්ෂ ද යන්න කොමසාරිස්වරයා වෙත දන්වනු ලැබිය යුතු ය ;

(ආ) 2 වන වගන්තිය යටතේ ප්‍රකාශනය ප්‍රසිද්ධ කිරීමෙන් සතියක් ඇතුළත ජනමතවිචාරණයේ දී මහජනතාව වෙත ඉදිරිපත් කරනු ලබන යෝජනාවට පක්ෂ ද, විපක්ෂ ද යන්න කොමසාරිස්වරයා වෙත දන්වා සිටීමට අපොහොසත් වන පිළිගත් දේශපාලන පක්ෂයක්, එම යෝජනාවට පක්ෂ හෝ විපක්ෂ නොවන ලෙස සලකනු ලැබිය යුතු ය. (තව ද එය මේ වගන්තියෙහි "අපක්ෂපාත පක්ෂයක්" ලෙස හඳුන්වනු ලැබේ) ;

(ඇ) (අ) ඡේදය යටතේ තොරතුරු ලැබුණු පසුව, ජනමතවිචාරණයේ දී මහජනතාව වෙත ඉදිරිපත් කරනු ලබන යෝජනාවට පිළිගත් දේශපාලන පක්ෂ වලින් බහුතරයක් පක්ෂ ද විපක්ෂ ද යන්න කොමසාරිස්වරයා විසින් තීරණය කරනු ලැබිය යුතු අතර, එම බහුතරය සමන්විත වන පිළිගත් දේශපාලන පක්ෂ සංඛ්‍යාව පහළොවෙන් ගුණ කරනු ලැබිය යුතුය. එම ගුණ කිරීමෙන් ලැබෙන සංඛ්‍යාව මෙහි මින් මතු "මුළු වෙන් කිරීම" යනුවෙන් හඳුන්වනු ලැබේ;

(ඈ) ජනමතවිචාරණයේ දී මහජනතාව වෙත ඉදිරිපත් කරනු ලබන යෝජනාවට පක්ෂයයි කොමසාරිස්වරයා වෙත දන්වා ඇති සියලු පක්ෂවලට, සමස්ත වශයෙන්—

(i) ගුවන් විදුලි ප්‍රචාර සම්බන්ධයෙන් වූ විට මුළු වෙන් කිරීම නොඉක්මවන විනාඩි ගණනක මුළු කාලසීමාවක් ; සහ

(ii) රූපවාහිනී ප්‍රචාර සම්බන්ධයෙන් වූ විට මුළු වෙන් කිරීම නොඉක්මවන විනාඩි ගණනක මුළු කාලසීමාවක්

ප්‍රයෝජනයට ගැනීමට ඉඩ දිය යුතු ය.

ජනමතවිචාරණයේ දී මහජනතාව වෙත ඉදිරිපත් කරනු ලබන යෝජනාවට තමන් පක්ෂයයි (අ) ඡේදය යටතේ කොමසාරිස්වරයා වෙත දන්වා ඇති පක්ෂ සංඛ්‍යාවෙන්, මුළු වෙන් කිරීම බෙදනු ලැබූ විට ලැබෙන සංඛ්‍යාව නොඉක්මවන විනාඩි

ගණනක කාලසීමාවක්, ගුවන් විදුලි හෝ රූපවාහිනී හෝ ප්‍රචාර සම්බන්ධයෙන් ප්‍රයෝජනයට ගැනීමට එක් එක් පක්ෂයට ඉඩ දෙනු ලැබිය යුතු ය;

(ඉ) ජනමතවිචාරණයේ දී මහජනතාව වෙත ඉදිරිපත් කරනු ලබන යෝජනාවට විපක්ෂයයි කොමසාරිස්වරයා වෙත දන්වා ඇති සියලු පක්ෂවලට, සමස්ත වශයෙන්—

(i) ගුවන් විදුලි ප්‍රචාර සම්බන්ධයෙන් වූ විට, මුළු වෙන් කිරීම නොඉක්මවන විනාඩි ගණනක කාලසීමාවක්; සහ

(ii) රූපවාහිනී ප්‍රචාර සම්බන්ධයෙන් වූ විට, මුළු වෙන් කිරීම නොඉක්මවන විනාඩි ගණනක මුළු කාලසීමාවක්

ප්‍රයෝජනයට ගැනීමට ඉඩ දිය යුතු ය.

ජනමතවිචාරණයේ දී මහජනතාව වෙත ඉදිරිපත් කරනු ලබන යෝජනාවට තමන් විපක්ෂයයි (අ) ඡේදය යටතේ කොමසාරිස්වරයා වෙත දන්වා ඇති පක්ෂ සංඛ්‍යාවෙන් මුළු වෙන් කිරීම බෙදනු ලැබූ විට ලැබෙන සංඛ්‍යාව නොඉක්මවන විනාඩි ගණනක කාලසීමාවක්, ගුවන් විදුලි හෝ රූපවාහිනී හෝ ප්‍රචාර සම්බන්ධයෙන් ප්‍රයෝජනයට ගැනීමට ඒ එක් එක් පක්ෂයට ඉඩ දෙනු ලැබිය යුතු ය;

(ඊ) අපක්ෂපාත පක්ෂයකට—

(i) ගුවන් විදුලි ප්‍රචාර සම්බන්ධයෙන් වූ විට, විනාඩි පහළොවක් නොඉක්මවන මුළු කාලසීමාවක්; සහ

(ii) රූපවාහිනී ප්‍රචාර සම්බන්ධයෙන් වූ විට, විනාඩි පහළොවක් නොඉක්මවන මුළු කාලසීමාවක්

ප්‍රයෝජනයට ගැනීමට ඉඩ දිය යුතු ය;

(උ) මේ වගන්තියේ ඉහත සඳහන් විධිවිධානවලට අනුකූලව එක් එක් පිළිගත් දේශපාලන පක්ෂයට ප්‍රයෝජනයට ගැනීමට ඉඩ දෙනු ලබන ප්‍රචාරක කාලය එක් එක් පිළිගත් දේශපාලන පක්ෂය වෙත කොමසාරිස්වරයා විසින් දැනුම් දෙනු ලැබිය යුතු ය;

(ඌ) ජනමතවිචාරණයේ දී මහජනතාව වෙත ඉදිරිපත් කරනු ලබන යෝජනාවට පක්ෂ වන්නා වූ හෝ විපක්ෂ වන්නා වූ සියලුම පිළිගත් දේශපාලන පක්ෂ, ඒ එක් එක් පක්ෂයට සමස්ත වශයෙන්

ප්‍රයෝජනයට ගැනීමට ඉඩ දී ඇති මුළු විනාඩි කාල සීමාව ම, මෙම වගන්තියේ ඉහත සඳහන් විධිවිධානවලට අනුකූලව තීරණය කරන ලද සමානුපාතවලට වෙනස් සමානුපාතවලින් ප්‍රයෝජනයට ගැනීමට තීරණය කරන අවස්ථාවක එම පක්ෂ විසින් එම මුළු විනාඩි ගණනක කාලසීමාව ප්‍රයෝජනයට ගැනීමට යෝජනා කරන සමානුපාතය, 2 වන වගන්තිය යටතේ ප්‍රකාශනයෙන් සති දෙකක් ඇතුළත දී කොමසාරිස්වරයා වෙත එම පක්ෂ විසින් දන්වනු ලැබිය යුතු අතර, යෝජිත සමානුපාතය අනුව, මුළු විනාඩි ගණනේ කාලසීමාව ප්‍රයෝජනයට ගැනීමට කොමසාරිස්වරයා විසින් ඔවුනට ඉඩ දෙනු ලැබිය යුතු ය.”; නවද

(2) ඒ වගන්තියේ අවසානයට පහත දැක්වෙන උපවගන්ති එකතු කිරීමෙන් :—

“(5) (2) වන උපවගන්තිය යටතේ යම් පිළිගත් දේශපාලන පක්ෂයකට වෙන් කර දෙන ලද කාලසීමාවට අමතරව (2) වන උපවගන්තියේ දැක්වෙන ප්‍රතිපත්ති ගැන සැලකිලිමත්ව කොමසාරිස්වරයා විසින් නිශ්චය කරනු ලැබිය හැකි යම් කාලසීමා සඳහා,ගුවන් විදුලි සහ රූපවාහිනී විකාශන පහසුකම් පාවිච්චි කිරීමට, සෑම පිළිගත් දේශපාලන පක්ෂයකටම කොමසාරිස්වරයා විසින් අවසර දෙනු ලැබිය හැකි ය.

(6) ජනමත විචාරණයේ දී මහජනතාව වෙත ඉදිරිපත් කරනු ලබන යෝජනාවට සහාය දෙන්නාවූ හෝ විරෝධය පාන්නා වූ හෝ සහාය දීමට නැතහොත් විරෝධය පෑමට නැඹුරු වන්නා වූ කිසිම දෙයක් මේ වගන්තියේ මීට ඉහතින් ඇති විධිවිධාන මගින් විධිවිධාන සලසා ඇති පරිදි හැර, 2 වන වගන්තිය යටතේ ප්‍රකාශනයේ දිනයෙන් ආරම්භව, ප්‍රතිඵලය ප්‍රසිද්ධ කරනු ලබන දිනයෙන් අවසන් වන කාලසීමාව තුළ දී ගුවන් විදුලිය මගින් හෝ රූපවාහිනිය මගින් හෝ ප්‍රචාරය කරනු නොලබන බවට ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ සභාපතිවරයා සහ ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවේ සභාපතිවරයා වග බලා ගත යුතු ය. මෙම විධිවිධාන ක්‍රියාත්මක කිරීමේදී, ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ සභාපතිවරයා සහ ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවේ සභාපතිවරයා කොමසාරිස්වරයා විමසා කටයුතු කළ යුතු ය.”.

**76අ සහ 76ආ වන වගන්ති ප්‍රධාන ප්‍රඥප්තියෙහි ඇතුළත් කිරීම.**

10. 76 වන වගන්තියට ඉක්බිතිව ම, පහත දැක්වෙන වගන්ති මෙයින් ඇතුළත් කරනු ලබන අතර, ඒවා ප්‍රධාන ප්‍රඥප්තියේ 76අ සහ 76ආ වන වගන්ති ලෙස බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිල (දේශීය) රු. 150 කි. (විදේශීය) රු. 200 කි. කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.